# පෞරාණික ඥාණය සුරැකී ඇති විහාරීය පුස්තකාල
## (මාතර දිස්ත්‍රික්කය ඇසුරින්)

එච්. කේ. අයි. සෙව්වන්දි[1]

ලංකාවේ මෙන්ම ලෝකයේ සෑම රටකම පැරණි යුගයේ සිට ශාස්ත්‍රීය කටයුතු කළ උගතුන් අතර, " පුස්තකාල" පිළිබඳ අදහස මුල් බැසගෙන තිබුන බව පැහැදිලිය. පිරිවෙන් අධ්‍යාපන ක්‍රම පැවති පැරණි ලංකාවේ සෑම පිරිවෙනකම "පොත්ගුලක්" පැවති බව ඉතිහාසයෙන් පෙනේ. එකල මුද්‍රණ ශිල්පයක් නොවූ බැවින්, පොතක පිටපත් සංඛ්‍යාව ස්වල්ප විය. සෑම උගතෙකු, ආධුනිකයෙකු ළඟම පිටපතක් නොවීය. එහෙයින් එකල පොත් පරිහරණය කිරිමට ඇති පහසුම මාර්ගය වූයේ "පොත්ගුල" භාවිත කිරිමයි. පැරණි ලංකාවේ "පොත්ගුල" ගැන අවධානය යොමු කරන විට පිරිවෙන් හා විහාරස්ථානවල වැදගත්කම අපට නොසලකා හැරිය නොහැකිය. ගමේ පන්සල එහි සංස්කෘතික මධ්‍යස්ථානය විය. භික්ෂූන්ට පමණක් නොව ගිහියන්ටද දැනුම ලබාදුන් කේන්ද්‍ර ස්ථානය වූයේ එයයි. මේ තත්වය නිසාම සෑම පන්සලකම යම්කිසි අන්දමක ග්‍රන්ථ සම්භාරයක් තිබුණ බව පිළිගත යුතුය. පොත්ගුල්වල පවත්නා ග්‍රන්ථ පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට හැකිවීම මෙම අධ්‍යයනයේ වැදගත්කම ලෙස දැක්විය හැකි අතර මෙහි අරමුණ වූයේ අප්‍රකටව පවත්නා විශේෂිත ග්‍රන්ථ හඳුනාගැනීමයි. එහෙයින් මාතර දිස්ත්‍රික්කය තුළ වූ පුරාණ පොත්ගුල් සහිත විහාරස්ථාන අතුරින් විහාරස්ථාන 16 ක් තෝරාගත්තේ සරල සසම්භාවී නියැදි ක්‍රමය අනුගමනය කරමිනි. එහිදී එම පොත්ගුල් භාරව සිටින ස්වාමීන් වහන්සේලා හා පරිපාලන පුද්ගලයින් ද නියැදිය වශයෙන් තෝරාගෙන ඇත. මෙසේ ඔවුන්ගෙන් ලබාගන්නා වූ ප්‍රතිචාර මත තොරතුරු රැස්කිරීම සිදුවිය. අධ්‍යයනයට අවශ්‍ය ප්‍රාථමික දත්ත රැස්කරගැනීමෙහිලා තෝරාගනු ලබන විහාරස්ථාන වල නායක ස්වාමීන් වහන්සේලා සමඟ සම්මුඛ සාකච්ඡා ස්වරූපයෙන් දත්ත ලබාගැනීමට ප්‍රශ්නාවලී ඉදිරිපත් කර ඇත. එහිදී ප්‍රශ්නාවලි මඟින් ලබාගන්නා තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කරගැනීම සඳහා නිරීක්ෂණ යන ක්‍රමවේදය ද භාවිත කර ඇත. සමීක්ෂිත දත්ත අනුව පෞරාණික වටිනාකම් සහිත ග්‍රන්ථ රාශියක් මෙම විහාරස්ථාන පුස්තකාලයන්හි අන්තර්ගත වී ඇති බව පැහැදිලි විය. ඒ අනුව පාළි, සිංහල, බුරුම භාෂාවලින් රචනා වී ඇති පුස්කොළ පොත් අත්පිටපත් ප්‍රමුඛ දේශීය ඥාණය අන්තර්ගත වී ඇති ග්‍රන්ථයන් සමුදායක් මෙහිදී දැකගත හැකිවිය.

ප්‍රමුඛ පද : පොත්ගුල්, පුස්කොළ පොත්, අත්පිටපත්, දේශීය ඥාණය

[1] සහකාර කථිකාචාර්ය, , පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය සමාජීය විද්‍යා පීඨය , කැලණිය විශ්වවිද්‍යාලය